රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/99(XIV)

මගේ අංකය :- EST7/TPORT/05/1010
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2010.04.21

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත,

## රජයේ නිලධාරීන් / අධිකරණ නිලධාරීන් /රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් සඳහා නිල ප්‍රවාහන පහසුකම්

රජයේ නිලධාරීන් / අධිකරණ නිලධාරීන් / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් සඳහා නිලප්‍රවාහන පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හි 03 ජේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එහි 3:1 වගන්තියේ (II) උප වගන්තියට අනතුරුව පහත සඳහන් සටහන එකතු කරමින් සංශෝධනය කරනු ලැබේ.

සටහන:-

විශ්‍රාම යන අවස්ථාවේ දරූ තනතුරේ පත්වීම, වැඩබැලීමේ හෝ රාජකාරි ඉටුකිරීමේ හෝ පදනම මත වුවද නිලධාරියා ඊට පූර්වාසන්නව මෙම වරප්‍රසාදය හිමි පහළ තනතුරක සේවය කර ඇත්නම් සහ අනෙකුත් සුදුසුකම් සපුරාලන්නේ නම් නිලධාරියාගේ පූර්ව තනතුරේ හා වැඩ බලන/ රාජකාරි ඉටු කරන තනතුරේ සේවා කාලය ද ඒකාබද්ධ කරමින් එම සම්පූර්ණ සේවා කාලය සලකා නිලධාරියා විශ්‍රාම යන අවස්ථාවේදී මෙම චක්‍රලේඛය යටතේ ලැබෙන වරප්‍රසාද සඳහා හිමිකම ලබයි.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත නිකුත් කෙරේ.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.